**ශීර්ෂය 192 - නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 රෙගුලාසිය ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂ 192 - නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්ය සාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 08 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.5 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1) (අ) | නිවැරදි සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම. | 2.3 |
| 127 (1) (ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. කළමනාකරණ දූර්වලතා | 2.2 |
| | | 2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.5.1<br>2.5.2<br>2.5.3 |
| 127 (2) | තමාගේ පාලනය යටතේ පවත්නා පාර්ලිමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම | 1. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.1.1 (අ) |
| | | 2. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.1.1 (ආ) |
| | | 3. විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය ඉටු නොවීම | 2.2 (ඇ) |

| | | | |
|---|---|---|---|
| 127 (6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නාවූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයට භාජනය කිරීම. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.4 |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**2.1 කාර්යසාධනය**

**2.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් කාර්යයන් 2017 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාත්මක කර නොතිබුණි.

i. ශ්‍රී ලංකා පොලිසියේ හා විශේෂ කාර්ය බලකායේ 320 ක බල ඇණියක් මාලදිවයින රාජ්‍යයේ සාම සාධක රාජකාරී සඳහා යෙදවීම.

ii. රු. මිලියන 100 ක ප්‍රතිපාදනයෙන් මත්ද්‍රව්‍ය පරායත්ත තත්ත්වයෙන් පෙලෙන පුද්ගලයන් මුදවා ගැනීමේ වැඩසටහන.

iii. කොළඹ හා අවට ප්‍රදේශවල සිදුකරන නීතිය හා සාමය පවත්වාගෙන යාම හා අනෙකුත් අවස්ථාවලදී අප්‍රමාදව සේවයේ යෙදවීම අරමුණු කරගෙන කඩිනම් අවශ්‍යතාවයක් ලෙස සලකා විශේෂ කාර්ය බලකායේ විවාහක නිලධාරීන් සඳහා රු. මිලියන 388.14 ක වියදමින් නිල නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට 2016 වර්ෂයේදී නව ව්‍යාපෘතියක් ලෙස සැලැසුම්කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 67 ක් වෙන් කර තිබූ නමුත් ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.

iv. 2014 වර්ෂයේ සිට යෝජිත පොලිස් විශ්ව විද්‍යාලය පොලිස් සහ අපරාධ යුක්ති විශ්ව විද්‍යාලය ලෙස නම් කර, ඉදිකිරීම් කටයුතු සඳහා අත්තිඩිය ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා පොලිසියට අයත් අක්කර 16 ක භූමියක් ද තෝරා ගෙන තිබුණි. එහෙත් විශ්වවිද්‍යාලය පිහිටුවීමට අදාල පනත් කෙටුම්පත සකස්කර සම්මතකර ගැනීම 2017 වර්ෂය අවසානවන විටත් සිදුකර නොතිබුණි.

v. රථවාහන දඩ මුදල් අයකර ගැනීම වේගවත් කිරීමත්, රාජ්‍ය ආදායමට එකතුවන දඩ මුදල් ප්‍රමාණය ඉහළ නැංවීමත්, මහජනයාට දඩ මුදල් ගෙවීම පහසු කිරීමත් අරමුණු කරගනිමින් රථවාහන මාර්ග නීති උල්ලංඝනය වූ අවස්ථාවලදී උසාවියට ඉදිරිපත් නොකරන වැරදි සඳහා ස්වයංක්‍රීයව දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදයක අවශ්‍යතාවය 2014 වර්ෂයේ සිට හඳුනාගෙන තිබුණි. ව්‍යාපෘතිය රාජ්‍ය හා පෞද්ගලික හිමිකාරීත්වය යටතේ සිදු කිරීම සඳහා කටයුතු කරමින් පැවතියද ස්වයංක්‍රීය දඩපත් ගෙවීමේ ක්‍රමය 2018 ජූලි 31 දින වන විටත් ස්ථාපිත කර නොතිබුණි.

vi.

(ආ) අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම
-------------------------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරි සඳහා අවශ්‍ය වාහන හා උපකරණ මිලදී ගැනීම සඳහා, 2017 වර්ෂයට වෙන්කල ප්‍රතිපාදනය රු.මිලියන 868.33 ක් විය. අවශ්‍ය වාහන සහ මූලික උපකරණ කාණ්ඩ 08 ක් යටතේ මිලදී ගැනීමට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණද, 04 වන කාණ්ඩය යටතේ විදුලි ජනක යන්ත්‍ර දෙකක් මිලදී ගැනීමට රු. මිලියන 8.17 ක් ගෙවීම පමණක් සමාලෝචිත වර්ෂය තුළදී සිදු කර තිබුණි.

ii. දකුණු පළාත් සංවර්ධන මණ්ඩලය ස්ථාපිත කිරීමට අදාළ පනත 2018 ජූලි 31 දින වන විටත් සම්මත කර නොතිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී දකුණු පළාත් සංවර්ධන මණ්ඩලය වෙනුවෙන් රු.මිලියන 120 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද, අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව ස්ථාපිත කර තිබූ දක්ෂිණ සංවර්ධන අතුරු මණ්ඩලයේ වියදම් සඳහා රු. මිලියන 52.08 ක් උපයෝජනය කරගෙන තිබුණි.

iii. සමාලෝචිත වර්ෂය තුළදී දකුණු පළාතේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ව්‍යාපෘති 724 කට වෙන්කළ රු.මිලියන 1,000 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 774.6 ක් ඉතිරිවී තිබුණි. එම ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘතිවලින් මාතර දිස්ත්‍රික්කයේ මාර්ග 09 ක කාපට් යොදා සංවර්ධනය කිරීම සඳහා වෙන්කරන ලද රු.මිලියන 326.00 ක් වූ ප්‍රතිපාදන ඇතුළත් වී තිබුණි.

## 2.1.2 තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම
----------------------------------------

2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්වීම මත ළගාකර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු 3 - නිරෝගී බව හා යහ පැවැත්ම හා 16 - සාමය, යුක්තිය හා ශක්තිමත් ආයතන යටතේ ඉලක්ක 06 ක් හඳුනාගෙන තිබූ අතර වගකිව යුතු ආයතනය ලෙස ශ්‍රී ලංකා පොලීසිය නම්කර තිබුණි. පාදක වර්ෂය 2015 යොදාගනිමින් දර්ශකයන් ගොඩනැගීම සිදුකරමින් පැවතියද, තිරසර සංවර්ධන ඉලක්ක කරා ලගාවීමේදී අදාළ කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍යවන සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබුණි.

## 2.2 කළමනාකරණ දුර්වලතා
-------------------------
පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධිමත් පරිදි අනුමත නොකළ ඒකක මිල ගණන් මත සහ ඉටු කිරීමට යෝජිත වැඩ විෂයට අදාල නොවන ඒකක මිල ගණන් මත ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් 2016 වර්ෂයේදී අමාත්‍යාංශය මඟින් ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වරුන් වෙත ලබා දුන් ප්‍රතිපාදන මත ක්‍රියාත්මක මාර්ග සංවර්ධන ව්‍යාපෘති 88 ක් සඳහා රු. 23,793,711 ක් වැඩි පුර ගෙවීම් කර තිබුණි.

(ආ) දක්ෂිණ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාර්ග දෙකක කොන්ක්‍රීට් ගල් අතුරා නවීකරණය කිරීම සඳහා කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 70 ක් හෙවත් රු.1,378,839 ක් රසායනාගාර පරීක්ෂණ වාර්තා රහිතව 2016 දෙසැම්බර් මස

කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. ඒ සඳහා පසුව ලබා ගෙන තිබුණු රසායනාගාර වාර්තා අනුව මෙම මාර්ග දෙක සඳහා යොදන ලද කොන්ක්‍රීට් කුට්ටි ගල් නියමිත සම්පීඩ්‍යතා ශක්තියෙන් (30 N/mm²) තොර බව තහවුරු වී තිබුණි.

(ඈ) විශේෂ කාර්ය බලකායේ විවාහක නිලධාරීන් සඳහා නිල නිවාස සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් සඳහා රු. 45,906,745 (වැට් සහිත) මිලකට කොන්ත්‍රාත්තුව ප්‍රධානය කර 2007 වර්ෂයේදී රු.9,181,393 ක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. එම ඉදිකිරීම් තාවකාලිකව අත්හිටුවා වැඩ කටයුතු යළි ආරම්භ නොකිරීම නිසා ගෙවන ලද අත්තිකාරම් මුදලින් සහතික කරන ලද වැඩ වටිනාකම අඩුකල පසුව ඉතිරි රු.4,917,990 ක් මෙතෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා පොලීසියේ රාජකාරී නියුතුව සිටියදී ආබාධිත තත්ත්වයට පත්වූවන්ගේ සුභසාධන කටයුතු ඉටු කිරීම සඳහා 2014 නොවැම්බර් 26 දින වීන සමූහාණ්ඩුවෙන් ලැබී භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබූ රු.4,150,000 ක මුදල මෙතෙක් එම අරමුණ සඳහා උපයෝජනය කර නොතිබුණි.

## 2.3 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2013 අගෝස්තු 16 දිනැති අංක 1823/70 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය ආරම්භකර තිබුණි. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 04 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය, ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2014 | පුනරාවර්තන | 5,863.2 | 5,650.1 | 213.1 | 3.6 |
| | මූලධන | 463.0 | 359.4 | 103.6 | 22.4 |
| | **එකතුව** | **6,326.2** | **6,009.5** | **316.7** | **5.0** |
| 2015 | පුනරාවර්තන | 6,640.8 | 6,566.0 | 74.8 | 1.1 |
| | මූලධන | 979.9 | 704.1 | 275.8 | 28.1 |
| | **එකතුව** | **7,620.7** | **7,270.1** | **350.6** | **4.6** |
| 2016 | පුනරාවර්තන | 7,466.7 | 7,042.6 | 424.1 | 5.7 |
| | මූලධන | 1,971.4 | 1,005.9 | 965.5 | 49.0 |
| | **එකතුව** | **9,438.1** | **8,048.5** | **1389.6** | **14.7** |
| 2017 | පුනරාවර්තන | 7,493.4 | 7,403.6 | 89.8 | 1.2 |

| | | | | |
|---|---|---|---|---|
| මූලධන | 3,272.7 | 887.0 | 2,385.7 | 72.9 |
| **එකතුව** | **10,766.1** | **8,290.6** | **2,475.5** | **23.0** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**විසර්ජන ගිණුම**
------------------

**(i) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**
-----------------------------------------------------

වැය විෂයයන් 24 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 125.4 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

**(ii) අධි ප්‍රතිපාදන සලසා තිබීම**
------------------------------

වැය විෂයයන් 23 ක් සඳහා එකතුව රු. මිලියන 3,030 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදන වලින් එකතුව රු. මිලියන 707 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 91 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**(iii) පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම මගින් ප්‍රතිපාදන සලසා ගැනීම**
---------------------------------------------------------------------------

වැය විෂයයන් 8 ක් සඳහා සලසා තිබුණු පරිපූරක ප්‍රතිපාදන එකතුව රු. මිලියන 2,940 කින් රු.මිලියන 2,135 ක් ඉතිරිව තිබුණි. එම ඉතිරිවීම් ප්‍රතිශතය ලබාගත් පරිපූරක ප්‍රතිපාදනයෙන් සියයට 21 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක විය.

**2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**
-------------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**
--------------------------------------------------

අමාත්‍යාංශයට අදාල විෂය අංක 19201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 100 | 82 | 75 | 100 | 230 | 111 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.2,015,762 ක් වූ අතර, 2018 ඔක්තෝබර් මස 15 දින වන විටත් ඉන් රු.1,332,808 ක් හිඟ හිට තිබුණි. එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 14 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**(ආ) දේපළ ණය අයකර නොගැනීම**

සමාලෝචිත වර්ෂය අවසානයේ දී නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.548,327 ක් ණය වර්ෂ 10 ඉක්මවා තිබුණි. 2004 ඔක්තොබර් 11 දිනැති අංක 118 අයවැය චක්‍රලේඛ 5.2 ඡේදයෙහි විධිවිධාන පරිදි නීතිපතිගේ උපදෙස් මත එම දේපළ වෙන්දේසි කිරීමෙන් රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.5 මානව සම්පත් කළමනාකරණය

### 2.5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩි නඩි සඳහා වියදම

ඉහත අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 5,258.22 ක් වැය කර තිබුණි.

**(අ) නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය කාර්යමණ්ඩලය**

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 18 | 17 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 06 | 03 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 65 | 47 | 18 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 34 | 29 | 05 |
| | **එකතුව** | **123** | **96** | **27** |

**(ආ)** **පොලිස් විශේෂ කාර්ය බලකාය - නිල ඇඳුම් කාර්ය මණ්ඩලය**

2017 දෙසැම්බර් 31 දිනට නිල ඇඳුම් කාර්ය මණ්ඩලය පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 68 | 46 | 22 |
| (ii) | තෘතියික මට්ටම | 346 | 308 | 38 |
| (iii) | ද්විතියික මට්ටම | 10,329 | 7,471 | 2,858 |
| | එකතුව | 10,743 | 7,825 | 2,918 |

(i) පොලිස් විශේෂ කාර්ය බලකායේ නිල ඇඳුම් කාර්යමණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 2,918 ක් විය. ඉන් පොලිස් කොස්තාපල් තනතුරෙහි පුරප්පාඩු සංඛ්‍යාව 2,331 ක් වූ අතර, එය අනුමත සංඛ්‍යාවෙන් සියයට 33 ක්ව පැවතීම හේතුවෙන් පොලිස් විශේෂ කාර්ය බලකායේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමට අවශ්‍ය නිලධාරීන් හඳුනාගෙන එම පුරප්පාඩු පිරවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) පොලිස් විශේෂ කාර්ය බලකායේ නිල ඇඳුම් කාර්ය මණ්ඩලය ජ්‍යෝෂ්ඨ මට්ටමට අයත් පුරප්පාඩු 22 ක් පැවතුණි. ජ්‍යෝෂ්ඨ පොලිස් අධිකාරී තනතුරු 22 න් 05 ක් හා සහකාර පොලිස් අධිකාරී තනතුරු 45 න් 17 ක් පුරප්පාඩුව පැවතුණි.

(iii) පොලිස් විශේෂ කාර්ය බලකාය සඳහා අනුමත අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතීම මත අභ්‍යන්තර විගණන කටයුතු සිදුව නොතිබුණි.

**(ඇ)** පොලිස් විශේෂ කාර්ය බලකාය - සිවිල් කාර්ය මණ්ඩලය

2017 දෙසැම්බර් 31 දිනට සිවිල් කාර්ය මණ්ඩලය පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 4 | 3 | 1 |
| (ii) | තෘතියික මට්ටම | - | - | - |
| (iii) | ද්විතියික මට්ටම | 65 | 34 | 31 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 631 | 566 | 65 |
| | එකතුව | 700 | 603 | 97 |

2.5.2 අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්

---------------------------------------------------------------------------

අමාත්‍යාංශය විසින් නිලධාරියෙක් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත මුදා හැර තිබූ අතර ඔහුගේ වැටුප් වශයෙන් රු.438,888 ක් ගෙවා තිබුණද එය ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

2.5.3 අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

---------------------------------------------------------------------------

වෙනත් ආයතනවල නිලධාරීන් 28 ක් හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාන්තා නිලධාරීන් 06 ක් අමාත්‍යාංශයේ රාජකාරී සඳහා යොදවාගෙන තිබුණි. ඔවුන්ගේ වැටුප් අදාළ ආයතන වෙතින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.